**කොළඹ නගරාශ්‍රිත දුම්රිය කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2017**

---

කොළඹ නගරාශ්‍රිත දුම්රිය කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 ඔක්තෝබර් 28 දින එළඹි අංක 3425 – ශ්‍රී (එස්එෆ්) දරන මූල්‍ය ගිවිසුමේ iv ව්‍යවස්ථාවේ 4.03 වගන්තියේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

ව්‍යාපෘති ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන්නේ ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය වන අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වේ. ශක්‍යතා අධ්‍යයන සංවර්ධනය, ප්‍රවාහන ව්‍යාපෘති සඳහා විස්තරාත්මක ඉංජිනේරු සැලසුම් සකස් කිරීම සහ ප්‍රවාහන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සහාය ලබාදීමට ප්‍රතිපාදන ඇති කිරීම වැනි කාර්යයන් ඇතුලත්ව ප්‍රමුඛතා ප්‍රවාහන ව්‍යාපෘති සූදානම් කිරීම සහ වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. මූල්‍ය ගිවිසුම අනුව,ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 1,853 කට සමාන ඇ.එ.ජ. ඩොලර් මිලියන 11.36 ක් වේ. ඉන් රු.මිලියන 1,405.06 කට සමාන ඇ.එ.ජ. ඩොලර් මිලියන 9.69 ක් ලබාදීමට ආසියානු බැංකුව එකඟ වී ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ඔක්තෝබර් 28 දින ආරම්භ කරන ලද අතර 2022 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිතය.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හා වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වුයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කල මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග සතුටුදායක ලෙස සංසන්දනය කර තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා පිළිගත් වර්ගීකරණයන්ට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව,

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව සහ

(ඌ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වුයේද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**
-----------------

**2.1 මතය**
------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය යෝග්‍ය ගිණුම් වාර්තා පවත්වාගෙන ගොස් ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුව ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කර ඇති බව,

(ආ) අරමුදල් ලබාදුන් කාර්යය සඳහාම උපයෝජනය කර ඇති බව,

(ඇ) අග්‍රිම ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව සහ

(ඇ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී රු.මිලියන 1.27 ක පිරිවැයකට මිලදීගත් දේපල පිරියත සහ උපකරණ එවැනි වත්කම්වල ප්‍රාග්ධන ස්වභාවය නොසලකා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පිරිවැය යටතේ දක්වා තිබුණි.

(ආ) නිවාස කුලී අත්තිකාරම් ලෙස ගෙවා තිබූ රු.මිලියන 4.5 ක් වර්ගීකරණ දෝෂයක් නිසා උපදේශක හා අනෙකුත් වියදම් යටතේ දක්වා තිබුණි.

(ඇ) රේඛීය අමාත්‍යාංශයෙන් අග්‍රිම ලෙස ලද මුදලින්, 2017 මැයි දක්වා ව්‍යාපෘති අධීක්ෂණය වෙනුවෙන් දරන ලද රු.මිලියන 2.20 ක් උපදේශක හා අනෙකුත් වියදම් යටතේ දක්වා තිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| **ප්‍රභවය** | **ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල** | | **සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම** | **2017 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල්** | |
|---|---|---|---|---|---|
| | **එජඩො මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **එජඩො මිලියන** | **රු. මිලියන** |
| ඒ.ඩී.බී. | 9.69 | 1,405.06 | 293 | 0.76 | 179.27 |
| ශ්‍රී ලං ර | 0.31 | 45.15 | 330 | - | 241.54 |
| **එකතුව** | **10.00** | **1,450.21** | **623** | **0.76** | **420.81** |

**3.2 භෞතික ප්‍රගතිය**

-----------------

ලද තොරතුරු අනුව, ව්‍යාපෘතිය පෞද්ගලික සමාගමක් සමග උපදේශක සේවා ලබාගැනීම, ශක්‍යතා අධ්‍යයන පිළියෙල කිරීම, විස්තරාත්මක ඉංජිනේරු සැලසුම් නිර්මාණය කිරීම, සැලසුම් සුරක්ෂිත කිරීම සහ ලංසු කැඳවීමේ ලියකියවිලි පිළියෙල කිරීම ආදී සේවා ලබාගැනීම සඳහා රු.මිලියන 379.21 කට සමාන යූරෝ 256,030 (ඇ.එ.ජ. ඩොලර් මිලියන 6.48) ක ඇස්තමේන්තු පිරිවැයකට 2017 දෙසැම්බර් මස ගිවිසුමකට එළඹී තිබුණි. කෙසේ වුවද, 2017 දෙසැම්බර් 31 දිනට මේ සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් වාර්තා වී නොතිබුණි.

**3.3 මතභේදයට තුඩුදෙන කරුණු**

-------------------------------

කැළණිවැලි දුම්රිය මාර්ගය දෙපස ජීවත්වන පදිංචිකරුවන් නැවත පදිංචි කිරීම සඳහා වාසයට සුදුසු තට්ටු නිවාස 852 ක් ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට ගෙවන ලද රු.මිලියන 300 ක අත්තිකාරම් මුදල සහ නැවත පදිංචි කිරීමේ සැලැස්මක් හා සමාජ ආර්ථික සමීක්ෂණයක් කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනයට ගෙවන ලද රු.මිලියන 24.05 ක මුදල රේඛීය අමාත්‍යාංශයේ විසර්ජන ගිණුමෙන් ගෙවා තිබූ අතර එම පිරිවැය ව්‍යාපෘතියේ පිරිවැය ලෙස සලකා තිබුණි. කෙසේ වුවද, එම නැවත පදිංචි කිරීමේ සැලැස්මේ කාර්යයන් ව්‍යාපෘති විෂය පථය යටතට නොගැනේ.